NATIONAL LIBRARY OF SRI LANKA 13/06/2023 14:46:08
306462

සහ ප්‍රවෘත්ති පත්‍ර
4 APR [illegible]
SRI LANKA

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1998 අංක 57 දරන වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA 13/06/2023 14:46:08

# 1998 අංක 57 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 15 වන දින.]

එල්. ඩී.–ඕ. 58/94.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1998 අංක 57 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ 49 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එය එම ආඥාපනතේ 49අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු යː– 431 වන අධිකාරයෙහි 49අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඇතැම් අවස්ථාවල දී සියලුම දායක මුදල් ආපසු ගෙවීම.

49අ. (1) මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී හෝ ඉන් පසුව, දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු වන දායකයකු –

(අ) විශ්‍රාම වැටුප් පිට රජයේ සේවයෙන් විශ්‍රාම ලබන්නා වූ ; හෝ

(ආ) ඉල්ලා අස්වීමෙන්, මාරු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් රජයේ සේවයෙන් ඉවත්ව යන්නා වූ ; හෝ

(ඇ) රජයේ සේවයේ සිටින අතරතුර මිය යන්නා වූ

අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දායකයා හෝ ඒ දායකයාගේ පෞද්ගලික නෛතික නියෝජිතයා, ඒ දායකයාගේ සියලුම දායක මුදල්, ඒ මත වර්ෂයකට සියයට දෙකහමාරක වැල් පොලිය ද සමග, ආපසු ලබාගැනීමට හිමිකම ලැබිය යුතු ය :

එසේ වුව ද, වයස අවුරුදු පනස් පහට එළඹීමට පෙර, රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ හෝ ඉවත් වූ දායකයකු ඒ වයසට එළඹෙන තුරු ඒ ආපසු ගෙවීමට හිමිකම නොලැබිය යුතු ය.

2—D 049830— 5,900 (98/09)

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA 13/06/2023 14:46:08



(2) මේ වගන්තිය යටතේ ආපසු ගෙවීමක් ලබන යම් දායකයකුට අරමුදලින් තවදුරටත් කිසිම හිමිකම් පෑමක් කළ නොහැකි විය යුතු ය.

(3) මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනට පෙරාතුව යම් දායක මුදලක් ආපසු ගෙවනු ලැබූ (1) වන උපවගන්තියේ සඳහන් යම් දායකයකු විසින්, එකී දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත, ඒ මුදල, ඒ මත වර්ෂයකට සියයට දෙකහමාරක වැල් පොලිය සමග ආපසු ගෙවන්නේ නම් පමණක්, මේ වගන්තියේ වාසිය සඳහා හිමිකම් පෑ හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.